# කුසුම්යා



සඳමිණි සූරියආරච්චි

# කුසුමියා

සඳමිණි සූරියආරච්චි

කතෘ

## පළමු දිග හැරීම

මහාමායා බාලිකා විදුහල

2025.12.05

**ISBN අංකය – 978 - 624 - 208 - 728 - 3**

# පිදුම


**මම මේ ලෝකේ වැඩියෙන්ම ආදරේ කරන මගේ දූ ඔකිත්මාට**

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# කුසුමියා



**ඈ** නමින් කුසුමියා නම විය. ඈ මට මුණ ගැසුණේ කුණු ගොඩක කවුරුන් හෝ දමා ගිය බෑගයක් ඇතුගෙනි. අම්මත් එක්ක කඩේට ගොස් එන විට මට හීන් කටහඬක් ඇහුණා
හරියට මට කවුදො කතා කරනවා වාගේ

මියෑව්


මියෑව්

ඒත්,

කුණුගොඩ පැත්තෙන් ?

ඒ හඬ මා ළං ළං වන විට තීව්‍රව ඇසේ

මා ඒ දෙසට හිමිහිට පා නැගුවෙමි.



සුදුම සුදු බෝල ගෙඩියක්

මල්ලක් ඇතුලේ

මං දිහා බලාගෙනම කෑ ගහනවා.

ඔලුව විතරයි පේන්නේ.

මං අතට ගත්තා.

# පූස් පැටියෙක්

මූණ සුදුම සුදුයි.

ඇඟ කලුයි සුදුයි.

මම දෑතින්ම ඔසවා ගත්තා

අම්මා ටිකක් අකමැති උණාත් මුකුත් කිව්වේ නැහැ.



එයාට හරිම සීතලයි මම පූස් පැටියාව ගෙදර ගෙනිහින් උණුවතුරෙන් හොඳට නෑව්වා. හොඳින් තෙතමාත්තු කළා බ්ලැන්කට් එකත් පොරවලා උණුසුම් කළා.

දවස පුරාම එයා නිදාගත්තා පූස් පැටියා අවදි උනහම කිරි දීසියක් හදලා ළඟින් තිබ්බා සුදු පූස් පැටියා කිරි ඔක්කොම බිව්වා.

මං දැන් මෙකක් කියලද එයාට

කතා කරන්නේ ?

කෝ නමක් ?

දැන් එයාට නමක් එපැයි.

එයා මං දිහා බලාගෙන ඉන්නවා. හරියටම කලු තිත් වැටුණු සුදු මලක් වගේ

# කුසුම්

මලට කියන තවත් නමක්

# කුසුමියා

මට හරිම ආදරයක් දැනුණා

# කුසුමියා

මට දැන් යාලුවෙක් ඉන්නවා

නම කුසුමියා. එයා මං එක්කමයි. මං නිදාගන්න කොට ඇඳට ඇවිත් මද එක්කම නිදා ගන්නවා ඉස්කෝලේ ඇරලා ගෙදර එනකොට ගේට්ටුව ළඟ මම එනතුරු මග බලාගෙන ඉන්නවා

ගෙදර ආවහම අපි සෙල්ලම් කරනවා මං පාඩම් කරන විට එයා මං පාඩම් කරන මේසේ උඩ නිදා ගන්නවා



දෙසැම්බර් මාසේ දවසක මං ඉස්කෝලේ ගිය වෙලාවක කුසුමියා අච්චිදින්න ගිහින්

එදා මොර සූරන වැස්ස

අහස කලු කරලා

කලුපාට වලාකුළු



කුසුමියා මං එනතුරු ගේට්ටුව ළඟ තෙමෙනවද මංද පණිවිඩයක්වත් යවන්න පුළුවන් නම්..... මං එන්න පරක්කු වෙනවා හොඳටම වැස්ස ගෙටවෙලා ඉන්න කියලා.



දැන් පෑව්වා.

මම ඉක්මනින් ගෙදර ගියා කුසුමියව බලන්න වෙනද වගේ කුසුමියා ගේට්ටුව ළඟ හිටගෙන හිටියේ නෑ එයා ගෙදරත් නෑ.

මම නැතුව අඬනවද දන්නෙ නෑ මට හැම තිස්සෙම එයාගේ මූණ මතක් වෙනවා සමහර දවස්වලට එයා චූටි චූටි නරක වැඩ කළහම මං කුසුමියා එක්ක තරහ වෙනවා. එතකොට එයාගේ ඇස් දෙකෙන් කඳුළු බින්දු දෙකක් වැටෙනවා



මට හරිම පවු කියලා හිතෙනවා එතකොට මං ආයේ යාළු වෙනවා.

මං හිතන හැමදේම මගේ පූස් පැටියාටත් හිතෙනවා ඇති.


අනේ මගේ පූසා කෝ ?

තනියම මොනවා කරනවා ඇතිද ?

මට මගේ යාලුවව හොයාගෙන යන්න හිතෙනවා ඒත් මං කොහේ කියලා යන්නද?



ඇඳට වෙලත් මං හොඳටම කල්පනා කරනවා. එතකොට මට ඇඬෙනවා.



මෙහෙම ඉන්න කොට මම තද නින්දකට වැටුණා

මට යාන්තමට ඇහැරුණා පුරුදු කටහඬක් ඇහුණා මම කළබලෙන් ඇඳෙන් බැස්සා

කවුද මේ ?

දොර ළඟ පුරු පුරු ගානවා

බැලින්නම් මගෙ කුසුමියා ඇවිල්ලා

කුසුමියා ?

කොහෙද ගියේ ?

මොකද උණේ?


වත්ත පහළ ඇළ ළඟ පඳුරක හිරවෙලා ඉඳලා අප්පුච්චා එක්කරගෙන අක්කරගෙන ඇවිත්.

හොඳටම තෙමිලා

එයා මාව දැක්ක ගමන් මගේ අතට පැන්නා

මඩේ වැටිලා

දුඹුරුම දුඹුරු පාටයි



ඒත් මං මගේ පූස් යාළුවාව

ආදරයෙන් බදා ගත්තා



''කුසුමියා මට නොකියා ආයේ කොහේවත්

යන්න එපා''

කියලා මම පූසව පොරොන්දු කර ගත්තා.

ඉන් පස්සේ අපි දෙන්නා සතුටින් ජීයවත් උණා.



# නිමි.



# සඳමිණි සූරියආරච්චි

කතෘ

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**ISBN අංකය – 978 - 624 - 208 - 728 - 3**